SriLankan Airlines

oneworld

# ශ්‍රීලංකන් එයාර්ලයින්ස් (සේවා මුර) කාර්ය මණ්ඩලයට ප්‍රවාහන සේවා සැපයුම්කරුවෙකු තෝරාගැනීම සඳහා ලංසු කැඳවීමට කෙරෙන ආරාධනයයි

## (IFB) යොමු අංකය: 201931002

ශ්‍රීලංකන් එයාර්ලයින්ස් (සේවා මුර) කාර්ය මණ්ඩලය සඳහා ප්‍රවාහන සේවා සැපයුම්කරුවෙකු තෝරාගැනීම පිණිස, අමාත්‍යංශ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති, සංචාරක අමාත්‍යංශය විසින් ශ්‍රීලංකන් එයාර්ලයින්ස් වෙනුවෙන් මෙසේ ලංසු කැඳවනු ලබයි.

සෑම ලංසුවක්ම, 2020/11/24 වන දින පෙරවරු 10.00ට පෙර (ශ්‍රී ලංකා වේලාව(GMT+0530) ලිපිකවරයක බහා, කවරය මුද්‍රා තබා, ලිපි කවරයේ ඉහළ වම් පස කෙළවරේ පැහැදිලිව (IFB) යොමු අංකය සටහන් කර, **ජ්‍යෙෂ්ඨ කළමණාකරු වාණිජ ප්‍රසම්පාදන, වාණිජ ප්‍රසම්පාදන දෙපාර්තමේන්තුව, ශ්‍රීලංකන් එයාර්ලයින්ස් ලිමිටඩ්, ගුවන් සේවා මධ්‍යස්ථානය, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ, කටුනායක, ශ්‍රී ලංකාව.** යන ලිපිනයට යොමු කොට භාරදිය යුතුයි.

සියලුම ලංසු අයැදුම්කරුවන් තම ලංසුව, අවම ලංසු ඇප සුරැකුමක් සහිතව ඉදිරිපත් කළ යුතුයි. එම ඇප සුරැකුම ලංසු ලේඛනයේ සඳහන් පරිදි ආපසු ගෙවනු ලබයි. එමෙන්ම එම ඇප සුරැකුම, 2021/06/20 දක්වා වලංගු වන, කොන්දේසි විරහිතව ආපසු හැරවිය නොහැකි, බැංකු ඇපකරයක් විය යුතු අතර, එය ශ්‍රීලංකන් එයාර්ලයින්ස් සමාගම නමට යොමු කළ යුතු වේ.

(ටෙන්ඩර් අවසන් වන දිනයේ සිට දින 208ක කාලයක් දක්වා) ඇප සුරැකුමක් නොමැති ලංසු සලකා බලනු නොලැබේ.

මේ සඳහා උනන්දුවක් දක්වන, සුදුසුකම් සහිත ලංසු අයැදුම්කරුවන් හට 2020/11/11 දින පස්වරු 4.00 දක්වා, 0710212773 යන දුරකථන අංකයට අමතා හෝ chintana.devapriya@srilankan.com / maheshini.kulathilaka@srilankan.com යන විද්‍යුත් ලිපින ඔස්සේ වැඩි විස්තර/තොරතුරු දැනගත හැකියි. ලංසු ලේඛන පරීක්ෂා කරගැනීමට **https://www.srilankan.com/en_uk/coporate/tender-notices** වෙත පිවිසිය හැකිය.

ලංසු අයැදුම්කරුවන් හට ලංසු ලේඛන කට්ටලය ලබාගත හැක්කේ, 2020/11/02 දින සිට 2020/11/12 දින, මධ්‍යහ්න 12.00 දක්වා වනතුරු පමණක් වන අතර, එම ලංසු ලේඛන කට්ටලය, ශ්‍රී ලංකා මුදලින් රුපියල් 35,000ක, ආපසු නොගෙවනු ලබන ගෙවීමක් සිදුකිරීමෙන් අනතුරුව ලබාගත හැකියි.

මේ සඳහා ගෙවිය යුත්තේ ඔන්ලයින් (Online) වන අතර, ගෙවීම් කටයුතු පහත සඳහන් බැංකු ගිණුමට බැර කළ යුතුයි.

බැංකුවේ නම - ලංකා බැංකුව
ගිණුමේ නම - ශ්‍රීලංකන් එයාර්ලයින්ස්
ගිණුම් අංකය - 0000000227
මුදල් අගය - ශ්‍රී ලංකා රුපියල්
ශාඛාව - ප්‍රධාන ශාඛාව
ශාඛා කේතය - 660
ස්විෆ්ට් කේතය – BCEYLKLX

ඔන්ලයින් ගෙවීම් කටයුතු සිදු කරන විට, ලංසු අයැදුම්කරුවන් විසින් “ලියාපදිංචි ව්‍යාපාර නාමය” පැහැදිලිව සටහන් කර, එම රිසිට්පත ඉහත සපයා ඇති විද්‍යුත් තැපැල් ලිපිනයට (Forward) ඉදිරිපත් කළ යුතු වේ. ගෙවීම තහවුරු කළ පසු ලංසු ලේඛනය, අදාළ පූර්ව ලංසු රැස්වීමෙහි නියමයන් සමගින් ලංසු අයැදුම්කරුගේ විද්‍යුත් තැපැල් ලිපිනය වෙතට යොමු කරනු ලැබේ.

2020/11/16 වන දින ශ්‍රී ලංකා වේලාවෙන් පෙරවරු 11.00ට (GMT + 05:30 Time Zone) MS Teams මගින් පූර්ව ලංසු රැස්වීමක් තත්‍යාකාරයෙන් සංවිධානය වේ.

ලංසු ලේඛන මිලදී ගත් ලංසු අයැදුම්කරු හෝ බලයලත් එක් නියෝජිතයෙකු, එම පූර්ව - ලංසු රැස්වීම සඳහා සහභාගී විය යුතුයි. බලයලත් නියෝජිතයෙකු එම රැස්වීම සඳහා සහභාගීවීමට අපේක්ෂා කරන්නේ නම්, එම තැනැත්තා, ලංසු අයැදුම්කරු විසින් ඒ බවට දැන්වූ ව්‍යාපාරික ලිපියක් මගින් ඒ සඳහා බලය පවරා, නිසි ලෙස වලංගු වන පරිදි සිය මුද්‍රාව සමග අත්සන් තබාගත් එම ව්‍යාපාරික ලිපිය, ලංසු ලේඛනය මිලදී ගැනීමේදී ඉහත සපයා ඇති විද්‍යුත් තැපැල් ලිපිනයට (Forward) ඉදිරිපත් කළ යුතු වේ.

ලංසු විවෘතකිරීම, 2020/11/24 වන දින ශ්‍රී ලංකා වේලාවෙන් පෙරවරු 10.30ට (ශ්‍රී ලංකා වේලාව(GMT+0530) **ගුවන් සේවා මධ්‍යස්ථානය, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ, කටුනායක, ශ්‍රී ලංකාව** හී දී ආරම්භ වේ. මෙම ලංසු විවෘතකිරීමේ අවස්ථාවට සහභාගීවීමට අවසර ලැබෙන්නේ, ලංසු තැබීමේ සමාගමෙන් එක් නියෝජිතයෙකු හට පමණක් බව කරුණාවෙන් සලකන්න.

ඇතුළුවීමේ අවසරපත් ලබාගැනීම සඳහා ඉහත සඳහන් කර ඇති පුද්ගලයෙකු වෙත කරුණාකර කල්වේලා ඇතුව යොමු වන්න.

**ශ්‍රීලංකන් එයාර්ලයින්ස් වෙනුවෙන්**
**අමාත්‍යංශ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති, සංචාරක අමාත්‍යංශය.**